**සැ. යු.** : 2025.04.25 දින පළ කරන ලද අංක 2434 *ගැසට්* පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,435 - 2025 මැයි මස 02 වැනි සිකුරාදා - 2025.05.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 738 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 756 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 මැයි මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 මැයි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

735- B 082677 — 5,403 (2025/05)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සැම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඵ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිෂ්‍යභට නිලධාරි/ නිලධාරිනියන් පුරප්පාඩු - 2025

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිෂ්‍යභට නිලධාරීන්/ නිලධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා සුදුසුකම් සපුරා ඇති පිරිමි හා කාන්තා අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

   අ. විධායක අංශය.
   ආ. සාගරික ඉංජිනේරු අංශය.
   ඇ. විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය.
   ඈ. සැපයුම් අංශය.
   ඉ. විනයාරක්ෂක අංශය.

3. මූලික අධ්‍යාපන සුදුසුකම් :

   අ. අ.පො.ස (සා/ පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් මව්බස, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබිය යුතුය.

   ආ. පහත අංශයන් සඳහා අ.පො.ස (උ/ පෙළ) විභාගයෙන් එක් වරකදී දක්වා ඇති පරිදි විෂයයන් 03ක් අදාළ විෂය ධාරාව යටතේ සමත්ව තිබිය යුතුය.

| | | |
|---|---|---|
| (1) විධායක | - | ජෛව විද්‍යාව සහ භෞතික විද්‍යා විෂය ධාරාවන් යටතේ ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයන් (S) 03ක් ලබා තිබීම. |
| (2) සාගරික ඉංජිනේරු | - | භෞතික විද්‍යාව විෂය ධාරාව යටතේ භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) 02ක් සහ සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබීම.<br>හෝ<br>Cambridge හෝ Edexcel (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් අවම වශයෙන් අධි සම්මාන සාමාර්ථ (B) 02ක් සහ සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම. |
| (3) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු | - | භෞතික විද්‍යාව විෂය ධාරාව යටතේ භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) 02ක් සහ සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබීම. |
| (4) සැපයුම් | - | වාණිජ විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් අතුරින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයන් (S) 03ක් ලබා තිබීම. |
| (5) විනයාරක්ෂක | - | ඕනෑම විෂය ධාරාවක් යටතේ විෂයයන් 03ක් සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) 03ක් ලබා තිබීම. |

4. අනෙකුත් සුදුසුකම්:

ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් පහත සඳහන් මූලික සුදුසුකම් අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුය.

| | | |
|---|---|---|
| අ. පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. |
| ආ. වයස | - | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුය. |
| ඇ. උස | - | පිරිමි - අඩි 5 අඟල් 6ට නොඅඩු විය යුතුය. (විනයාරක්ෂක අංශය සඳහා අඩි 5 අඟල් 7ට නොඅඩු විය යුතුයි.)<br><br>කාන්තා - අඩි 5 අඟල් 3 ට නොඅඩු විය යුතුය. (විනයාරක්ෂක අංශය සඳහා අඩි 5 අඟල් 4ට නොඅඩු විය යුතුයි.) |
| ඈ. බර | - | පිරිමි - කි.ග්‍රෑ. 52ට නොඅඩු විය යුතුය.<br>කාන්තා - කි.ග්‍රෑ. 41ට නොඅඩු විය යුතුය. |
| ඉ. පපුව (පිරිමි පමණි) | - | අඟල් 32ට නොඅඩු විය යුතුය. |
| ඊ. වර්ණ දෘෂ්ටිය | - | එස්ටීඩී II විය යුතුය. |
| උ. දෘෂ්ටි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) විය යුතුය. |
| ඌ. වෙනත් අධ්‍යාපන සුදුසුකම් | - | අ.පො.ස (උ/පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණයට ලකුණු 30ට නොඅඩුව ලබා තිබිය යුතුය. |
| | - | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන අ.පො.ස (උ/පෙළ) විභාග සහතිකයේ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ලබා තිබිය යුතුය. (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අ.පො.ස (උ/පෙළ) විභාග සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය). |
| එ. සිවිල් තත්ත්වය | - | අවිවාහක විය යුතුය (කිසිදු ශිෂ්‍යභට නිලධාරි/නිලධාරිනියක හට පුහුණුව ලබන කාල සීමාව තුළ දී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගත වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ). |

5. අ.පො.ස (සා/පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා අතිරේක විෂයයන් සලකා බලනු නොලැබේ.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ දක්වා ඇති විශිෂ්ට දක්ෂතාවයන් සඳහා බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියේ දී විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. ඉහත සඳහන් 3. සහ 4. ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සේවා කොන්දේසි :

අ. අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිෂ්‍යභට නිලධාරින්/ නිලධාරිනියන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු වේ.
බඳවා ගැනීමේ අංශයන්ට අදාළ මූලික පුහුණුව සාර්ථකව නිම කරන ශිෂ්‍යභට නිලධාරින්/ නිලධාරිනියන් වැඩ බලන උප ලුතිනන් නිලයේ අධිකාරියට පත් කරනු ලැබේ.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හෝ ලෝකයේ ඕනෑම රටක විදේශ පුහුණුවීම් සඳහා හෝ බඳවාගනු ලබන සියලුම ශිෂ්‍යභට නිලධාරින්/ නිලධාරිනියන් සූදානමින් සිටිය යුතුය.

ඇ. පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන් පසුව සියලුම ශිෂ්‍යභට නිලධාරින්/ නිලධාරිනියන් රාජකාරි හෝ පුහුණුවීම සඳහා හෝ ඕනෑම අවස්ථාවකදී ශ්‍රී ලංකාවේ හෝ ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතුය.

ඈ. පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන් පසුව සියලුම ශිෂ්‍යභට නිලධාරින්/ නිලධාරිනියන් දැනට පවතින ශ්‍රී ලංකා නාවික හමුදා පනත, ශ්‍රී ලංකා නාවික හමුදා නියෝග සහ සංදේශ මගින් බලගන්වනු ලබන නීති හා උපදෙස්වලට යටත් විය යුතු අතර, මින් මතුවට පනවනු ලබන නීති හා උපදෙස්වලට යටත් වීමටද බැඳී සිටිය යුතුය.

ඉ. පුහුණුව ලබන කාල සීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම් ශිෂ්‍යභට නිලධාරියෙකුගේ/ නිලධාරිනියකගේ විනය විරෝධී නොමනා හැසිරීම මත හෝ ඔහු/ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම්, එම අවස්ථාවේදී, එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අදාළ ශිෂ්‍යභට නිලධාරියාගෙන්/ නිලධාරිනියගෙන් අයකර ගැනීමට හෝ ඔහු/ ඇය නොගෙවන්නේ නම් ඇපකරුවන් විසින් හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට හෝ ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමඟ ගිවිසුමකට සහ බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

ඊ. පුහුණුවන කාලසීමාව තුළදී, යම් ශිෂ්‍යභට නිලධාරියෙකු/ නිලධාරිනියෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා නාවික හමුදා ක්‍රියා පිළිවෙතට අනුකූලව ලිඛිතව අනුමැතිය ලබාගත යුතු අතර, ශ්‍රී ලංකා ජනරජය මගින් එම ශිෂ්‍යභට නිලධාරියා/ නිලධාරිනිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ශිෂ්‍යභට නිලධාරියා/ නිලධාරිනිය හෝ ඔහු/ ඇය නොගෙවන්නේ නම් ඇපකරුවන් විසින් හෝ ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

උ. පුහුණු කාල සීමාව තුළදී, සිදුවන අනතුරුවල දී සහ පූර්ණ කාලීන දුබලතාවල දී දැනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ක්‍රියාත්මක වන රක්ෂණය මගින් ආවරණය සලසනු ලබන අතර, ඒ සඳහා විශේෂ වන්දි ගෙවීමකට හෝ වගකීමකට හෝ ශ්‍රී ලංකා නාවික හමුදාව බැඳී නොමැත.

9. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා :

තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් මතුවට පනවනු ලබන නියෝග හා රෙගුලාසි පිළිපැදිය යුතුවේ.

10. වැටුප් හා දීමනා (පුහුණුව ලබන කාල සීමාවේ දී) :

ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2025 ට අනුව වේ.

| විස්තරය | ශිෂ්‍යභට නිලධාරි (රු.) | මධ්‍ය නිලධාරි (රු.) |
|---|---|---|
| මූලික වැටුප | 47,817.00 | 48,277.00 |
| ජීවන වියදම් දීමනාව | 17,800.00 | 17,800.00 |
| නිල ඇඳුම් දීමනාව | 525.00 | 525.00 |
| අමතර දීමනාව | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 |
| සළාක දීමනාව (අවස්ථාවට අනුව) | 34,846.80 | 34,846.80 |
| එකතුව | 104,988.80 | 105,448.80 |

11. පුහුණුව ලබන කාල සීමාවේ දී හා ඉන් පසුව හිමිවන පහසුකම්, දීමනා සහ වරප්‍රසාද :

අ. බඳවාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් අතරින් තෝරාගත් පුද්ගලයන් හට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ විශ්වවිද්‍යාල වලට අනුයුක්තව උපාධි පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව හිමිවනු ඇත.

ආ. බඳවාගනු ලබන සෙසු අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් හට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උපාධි පාඨමාලාවන් හෝ දේශීය/ විදේශීය ආයතනයන් හි උපාධි පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව හිමිවනු ඇත.

ඇ. බඳවා ගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් හට ආහාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.

ඈ. නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/ නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

ඉ. කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට/ නිලධාරිනියන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරී නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ අදාළ බස් ගාස්තු ගෙවනු ලැබේ. (නාවික හමුදා බස්රථ සේවා ක්‍රියාත්මක නොවන ප්‍රදේශ සඳහා).

ඊ. නිල ඇඳුම් සහ ඊට අතිරේක අයිතමයන් නොමිලයේ සපයනු ලැබේ.

උ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ. (අදාළ පරිදි නිලධාරියාට/ නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට)

ඌ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරින්ට/ නිලධාරිනියන්ට රු.3,200.00 සිට රු.8,500.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

එ. ආහාර බැහැරින් සපයා ගන්නා නිලධාරින්/ නිලධාරිනියන් සඳහා සළාක දීමනාවක් හිමිවේ.

ඒ. ‘‘සුදුසුකම් වැටුප’’ අදාළ පරිදි මසකට උපරිම රු. 637.50 ක් දක්වා ගෙවනු ලැබේ.

12. අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට උපදෙස්:

අ. පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව පැහැදිලි අත්අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් **2025 මැයි මස 23 වැනි දින දහවල් 1200** පැයට ප්‍රථම ලැබෙන සේ ‘ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ 01’ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ‘ශිෂ්‍යභට නිලධාරි තනතුර’ යනුවෙන් සටහන් කළ යුතුයි. තවද, ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් මාර්ගගත ක්‍රමයටද අයදුම් කළයුතු අතර මෙම දෙයාකාරයෙන් ම ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකි අතර, වැඩි විස්තර දුරකතන අංක 011-7195120/ 011-7195154, 0760275685 මගින් ලබා ගත හැක.

ආ. ප්‍රතික්ෂේපිත අයදුම්පත් පිළිබඳව දැනුම්දීමක් සිදු කරනු නොලැබේ. තැපෑලේ දී යම් අයදුම්පත්‍රයක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට වන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අයදුම්පත් ලද බවට දැනුම්දීමක් සිදු කරනු නොලැබේ.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායාස්ථික පිටපත් අමුණා එවිය යුතුය. :

(1) උප්පැන්න සහතිකය,
(2) අයදුම්කර ඇති අංශවලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන/ උසස් අධ්‍යාපන/ වෘත්තීය අධ්‍යාපන සහතික,
(3) පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය,
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය,
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පළපුරුද්දක් ඇත්නම්, ඒ පිළිබඳ සහතික,
(6) මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක් (අයදුම්කරු/ අයදුම්කාරිනිය පිළිබඳ අවුරුදු දෙකකට වැඩි කාලයක් දැන සිටින වගකිව යුතු පුද්ගලයන්ගෙන් විය යුතුය.),
(7) ක්‍රීඩා හා වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

ඈ. නියම කරන ලද අවස්ථාවන්හී දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්‍ෂක/ අපේක්‍ෂිකාවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය. එසේ අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා, එම සහතික අස්ථානගත වුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

13. ඉල්ලුම්පතෙ හි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අයදුම්කරු/ අයදුම්කාරිනිය තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත්, ඔහුගේ/ ඇයගේ අපේක්‍ෂකත්වය අහිමි කිරීමට ද තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ ඇය දඬුවම් සහිතව සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

14. බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය;

අ. ඉහත අවශ්‍යතාවන් සපුරාලන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, වයස, ඇස් පෙනීම හා බර පරීක්‍ෂා කිරීම සඳහා මූලික වෛද්‍ය පරීක්‍ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ දක්වා ඇති පරිදි උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ/ අයදුම්කාරිනියකගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිවරයාගේ අනුමැතිය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ. මූලික සම්මුඛ පරීක්‍ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබයි. (සංශෝධනවලට යටත්ව)

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්‍ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා; (සංශෝධන වලට යටත්ව)

| *ඉසව්ව* | *වාර ගණන* | | *කාලය* | |
|---|---|---|---|---|
| | *පිරිමි* | *කාන්තා* | *පිරිමි* | *කාන්තා* |
| මීටර් 1600 දිවීම | - | - | මිනිත්තු 09 | මිනිත්තු 11 |
| Push ups | 12 හෝ ඊට වැඩි | 08 හෝ ඊට වැඩි | මිනිත්තු 01 | මිනිත්තු 01 |
| Sit ups/ Curl ups | 10 හෝ ඊට වැඩි | 07 හෝ ඊට වැඩි | මිනිත්තු 01 | මිනිත්තු 01 |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්‍ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් නාවික මහ රෝහල මගින් සිදුකරන පූර්ණ වෛද්‍ය පරීක්‍ෂණය සඳහා නැවත නාවික හමුදා වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කරන අතර, වෛද්‍ය පරීක්‍ෂණය සමත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් දෙවන සම්මුඛ පරීක්‍ෂණය සඳහා කැඳවීම් කරනු ලබයි. එම පරීක්‍ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කෙරෙන අතර පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් බඳවා ගැනිමට සුදුසුකම් ලබයි.

ඈ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

ඉ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්‍ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය WhatsApp /Mobile/Emailපණිවිඩයක් මගින් පමණක් දැනුම් දෙන අතර කිසිදු පණිවිඩයක් ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු නොලැබේ. සම්මුඛ පරීක්‍ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඊ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු/ අයදුම්කාරිනියක කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

උ. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද, එසේ කළ යුත්තේ ඔහුගේ/ ඇයගේ චරිතය පිළිබඳ සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම, එම අයදුම්කරු/ අයදුම්කාරිනිය නුසුදුසු අයෙක් වීමට හේතුවන්නේය.

ඌ අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

එ. සියලුම අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

15. ශ්‍රී ලංකා නාවික හමුදාවට ශිෂ්‍යභට නිලධාරින්/ නිලධාරිනියන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපතිවරයා සතුවන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපතිවරයා සතුවේ.

සටහන - මෙම *ගැසට්* නිවේදනය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන් ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

බීජ්කේඑස්පී බානගොඩ, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593,
කොළඹ 01.

ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිෂ්‍යභට නිලධාරි/ නිලධාරිනි සඳහා ඉල්ලුම්පත

1. පුරවැසිභාවය : ………………………………………………………………………………………..………………..
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. ඉල්ලුම් කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) : ……………………………………………………………………………

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) : ……………………………………………………………………………

4. ජාතික හැඳුනුම්පත් අංකය : ………………………………………………………………………………………………

5. ස්ථිර ලිපිනය : ……………………………………………………………………………………………………………

6. තැපැල් ලිපිනය : …………………………………………………………………………………………………………

7. විද්‍යුත් ලිපිනය : …………………………………………………………………………………………………………

8. උපන් දිනය : ………………………………………………………………………………………………………………

9. වයස අවුරුදු .................මාස ……….…... දින ............. (2025 ……………මස………… වන දිනට)

10. උස (අඟල්) ............................ පපුව (අඟල්) ............................. බර (කි.ග්‍රෑ.) .....………..............…………………

11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය: ……………………………………………………………………………

12. දිස්ත්‍රික්කය: ………………………………………………………………………………………………………………

13. ඡන්ද කොට්ඨාසය: ……………………………………………………………………………......…………………

14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය: ………………………………………………………………...…………………

15. දූරකතනඅංකය සහ WhatsApp අංකය: ..………………...……..……………………………….…………………

16. විවාහක / අවිවාහක බව: ……..…………………………………………………………...…………………

17. ස්ත්‍රී පුරුෂ භාවය: ……………………………………………………………………….....…………………

18. අධ්‍යාපනය ලැබූ පාසල් පිළිබඳ විස්තර:

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස (සා/පෙළ)<br>අ.පො.ස (උ/පෙළ)<br>වෙනත් | | |

19. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

21. ඉල්ලුම්කරන අංශය සඳහා ඇති විශේෂ සුදුසුකම්: …………………………………………………………………… …………………………………………………………………………………………………..……………………

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න): …………………………..…………………………………………………………………

23. පාසලේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමඟ විස්තර දක්වන්න): ……………………… …………..……………………………………………………………...................................................................... ......................................................................................................................................................................... ........................................……………………………………………………………………………………

24. සන්නද්ධ සේවා/ ස්වේච්ඡා බල සේනාවේ/ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය: …………………… ……………………………………………………………………………………………………………………

25. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම්කර තිබේ ද? එසේනම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න: ……………………………… ……………………………………………………………………………………………………………………

26. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේද? එසේනම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න:.....................................................................................................................

27. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

28. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා අදාළ වන රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

..................................................,
අයදුම්කරුගේ/අයදුම්කාරිනියගේ අත්සන.

දිනය :.........................

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් (සුදුසුකම්වල අදාළ ලිපි ලේඛනවල සහතික කරන ලද පිටපත් ද සමඟ) ලිපිනයට යොමු කරන්න.

ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්)
නාවික හමුදා මූලස්ථානය
තැ. පෙ. 593,
කොළඹ 01.

සම්බන්ධතා විස්තර - විද්‍යුත් තැපැල : nhqssorec@gmail.com දුරකථන : 0117195154, 0117195120 ජංගම දුරකථන : 0760275685

05-24

---

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ පුහුණුවීම් කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව විසිර යනු ලබන කෙඩෙට් නිලධාරීන් හට **හමුදා අධ්‍යයන ඩිප්ලෝමාව පිරිනැමේ.** ඔවුන් **දෙවන ලුතිනන්** වන ආරම්භක නිලයෙන් අධිකාරියට පත්කොට යෝග්‍යතාවයන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් ද අනුව යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත ඇතුළත් කරනු ලැබේ.

3. මූලික සුදුසුකම් :

| | | | |
|---|---|---|---|
| *අ.* | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| *ආ.* | විවාහක/අවිවාහක බව | : | අවිවාහක |
| *ඇ.* | වයස | : | 2025 ජූලි මස 30 දිනට වයස අවුරුදු 18 ත් 26 ත් අතර විය යුතුයි. |
| *ඈ.* | උස | : | අඩි 5 යි අඟල් 6 ට (170.6 cm) නොඅඩු විය යුතුයි. |
| *ඉ.* | බර | : | කි.ග්‍රෑ. 50 (රාත්තල් 110) ට නොඅඩු විය යුතුයි. |
| *ඊ.* | දෘෂ්ටි තීක්ෂණත්වය | : | 6/6 විය යුතුය (උපැස් සහ කාච රහිතව). |
| *උ.* | ශරීර ස්කන්ධ දර්ශකය | : | 18.5 $kg/m^2$ – 25 $kg/m^2$ ත් අතර විය යුතුය. |

4. **අධ්‍යාපන සුදුසුකම් :**

අ. අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ. පො. ස. (සා.පෙළ) විභාගය හා සමානව සලකනු ලබන වෙනත් ජාත්‍යන්තර විභාගයකින් (Pearson, Edexel, GCSE, GCE හෝ Cambridge ) දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව ගණිතය හා සිංහල/ දෙමළ ඇතුළුව විෂයයන් හයක් (06) සමත්වීම.

ආ. අ.පො.ස. (උ. පළ) විභාගයෙන් හෝ ඒ හා සමාන සුදුසුකමක් සහිතව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ. පො. ස. (උ. පෙළ) විභාගය හා සමානව සලකනු ලබන වෙනත් ජාත්‍යන්තර විභාගයකින් (Pearson, Edexel, GCSE, GCE හෝ Cambridge ) එක්වරක දී විෂයයන් තුනක් (03) සමත්වීම සහ සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ක ප්‍රතිශතයක් ලබා තිබීම.

ඇ. උසස් අධ්‍යාපන සුදුසුකම් හෝ ක්‍රීඩා තරගවලින් ජයග්‍රහණ ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

5. *වෙනත් සුදුසුකම්* : ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. **පොදු :**

අ. යම් තැනැත්තෙක් යුද්ධ හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලැබූ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් සම්බන්ධයෙන් වූ කොන්දේසි සපුරාලන්නේ නම් පමණක් ඔහු ස්වේච්ඡා බලසේනාවේ නිලධාරියෙකු වශයෙන් අධිකාරියක් ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

ආ. 1956 සැප්තැම්බර් මස 25 වැනි දින හෝ ඊට පසු ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවට අධිකාරිලත් සියලුම නව ප්‍රවේශක නිලධාරීන් විසින් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් වූ නියමිත ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ නියමයන්ට සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා සහ අනාගතයේ දී ඉදිරිපත් කරනු ලැබිය හැකි කවර හෝ නියෝගයකට *නැතහොත්* නියමයකට අනුකූලව ක්‍රියාකළ යුතුය.

ඇ. යම් කිසි නිලධාරියෙකුගේ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් නැතිවී ගිය විටක දී ඔහු විසින් වහාම ඒ බව යුද්ධ හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය යුතුයි.

ඈ. ස්වේච්ඡා බලසේනාවේ සේවයේ යෙදී සිටිය දී කිසිම නිලධාරියෙකු ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නොබැඳිය යුතුය.

ඉ. නිත්‍ය හමුදාවේ, නිත්‍ය උපසේවයේ, ශ්‍රී ලංකා පොලිසියේ හෝ ශ්‍රී ලංකා බන්ධනාගාර සේවයේ කිසිම සාමාජිකයෙකුට ස්වේච්ඡා හමුදාවේ සේවයට අධිකාරිය ලැබිය නොහැක.

ඊ. රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන යටතේ නිත්‍ය බලසේනාවෙන් රාජ්‍ය සේවයෙන්, රාජ්‍ය සංස්ථාවකින්, රාජ්‍ය ආයතනයකින් හෝ සංස්ථාපිත මණ්ඩලයකින් විශ්‍රාම ගත් හෝ අස්කළ කිසිවෙකු ස්වේච්ඡා බලසේනා රෙජිමේන්තුවක හෝ ඒකකයක සේවයට අධිකාරිය නොලැබිය යුතුය.

උ. සාපරාධී වරදක් සම්බන්ධයෙන් වරදකරුවෙකු කරනු ලැබූ කිසිවෙකු ස්වේච්ඡා බලසේනාවේ රෙජිමේන්තුවක හෝ ඒකකයක සේවයට අධිකාරිය නොලැබිය යුතුය.

ඌ. පුහුණුවීම් ලබන කාලය තුළ දී කෙඩෙට් නිලධාරීන් හට විවාහවීමට අවසර දෙනු නොලැබේ.

එ. මනා ශාරීරික සෞඛ්‍ය තත්වයේ සිටිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතුය.

7. **සේවා කොන්දේසි :**

අ. පුහුණු කාලසීමාව අවසානයේ සිට (අධිකාරියට පත්කරනු ලබන දිනයේ සිට) වසර 05 ක් අනිවාර්යයෙන් ම යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිය යුතුය. ඒ සඳහා යුද්ධ හමුදාව සමඟ ඇප බැඳුම්කරයකට සහ ගිවිස්නාවකට යටත් කරනු ලැබේ.

ආ. පුහුණුවීම් ලබන කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකුගේ මාසික වැටුප රු. 91,551.80 කි (සියලු දීමනා සහිතව). කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් සේවය කරන කාලය තුළ දී ඔවුන්හට කිසිදු වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

ඈ. කෙඩෙට් නිලධාරින් හට ශ්‍රී ලංකාවේ දී මාස 15 ක කාලයක් යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී පුහුණුවීම්වල නිරත වීමට සිදුවේ.

ඇ. පුහුණුවීමේ කාලය තුළ දී කෙඩෙට් නිලධාරින්ගේ තරාතිරම සෙසුනිලයින් හා සමානවන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

ඉ. පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම.

(1) පුහුණුවීම් කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකු සිය කැමැත්තෙන් ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කෙඩෙට් නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මඟින් දරන්නට යෙදුනු සියලුම වියදම භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(2) කෙඩෙට් නිලධාරියෙකු පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතුන් නිසා අස්කිරීම, තම අයහපත් ආරක්ෂක නිශ්කාෂණ, තමන් විසින් වළක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරින් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මඟින් ඔහු වෙනුවෙන් දරන්නට යෙදුනු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(3) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතූන් මත නුසුදුසු යැයි පුහුණුවෙන් ඉවත් කරන ලද කෙඩෙට් නිලධාරියෙකුට නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් බැඳීමට නොහැක.

8. වැටුප් හා දීමනා.- ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නිලධාරින් වශයෙන් දෙවන ලුතිනන්වන ආරම්භක නිලයෙහි අධිකාරියට පත්කරනු ලැබීමේ දී, ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරින්ට අදාළවන පහත දැක්වෙන වැටුප් තලයෙහි/ පරිමාණයෙහි තබනු ලැබේ.

| අ/අ | නිලය | ක. සේ. ච 3/2016 ට | |
|---|---|---|---|
| | | ඒකාබද්ධ වැටුප 2020.01.01 දින සිට | වාර්ෂික වැටුප් වර්ධක 2020.01.01 දින සිට |
| 1 | කෙඩෙට් නිලධාරි | රු. 32,380.00 | - |
| 2 | 2/ලුතිනන් | රු. 38,605.00 | - |
| 3 | ලුතිනන් | රු. 47,615.00 | 30 x 1335 |
| 4 | කපිතන් | රු. 55,625.00 | 24 x 1335 |
| 5 | මේජර් | රු. 60,965.00 | 22 x 1335 |
| 6 | ලුතිනන් කර්නල් | රු. 62,595.00 | 22 x 1630 |
| 7 | කර්නල් | රු. 76,175.00 | 17 x 2170 |
| 8 | බ්‍රිගේඩියර් | රු. 80,515.00 | 15 x 2170 |
| 9 | මේජර් ජෙනරාල් | රු. 88,000.00 | 12 x 2700 |
| 10 | ලුතිනන් ජෙනරාල් | රු. 93,400.00 | 10 x 2700 |
| 11 | ජෙනරාල් | රු. 101,500.00 | 7 x 2700 |

9. අනෙකුත් දීමනා : පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ.

අ. සුදුසුකම් දීමනා,

ආ. නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව,

ඇ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක නිලධාරීන්ට පමණක්).

ඈ. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

10. පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේ.

අ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්,
ආ. කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී,
ඇ. නොමිලේ නිල ඇඳුම්,
ඈ. විවාහක නිලධාරින්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරින් අනුගාමික සේවය,
ඉ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරින්ට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරි දුම්රිය බලපතක්.

11. මෙහි පහත 12 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එය අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ. තෝරාගත් අපේක්ෂකයින්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමඟ ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතුය. විශේෂ අවස්ථාවල දී හැර පියා ජීවතුන් අතර සිටින කෙඩෙට් නිලධාරියෙකුගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරීත්වය හිමිවනු ලැබේ.

12. අයදුම්කරුවන්ගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරි ඉල්ලුම්කරුගේ ..........................ගේ පියා*/මව*/භාරකරු* මම වෙමි.

ආ. ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී පුහුණුවීමේ පාඨමාලාවක් හැදැරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි.

(1) පුහුණුවීමේ කාලසීමාව තුළ දී අයදුම්කරුවන්ට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට.

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන් ම අධිකාරය අවසන් කළහොත්, ඔහු වෙනුවෙන් රජයට දැරීමට සිදුවූ සියලු වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට.

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින් ම වළක්වාලිය හැකි හේතූන් හෝ නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

* නොගැලපෙන වචන කපා හරින්න.

.........................................,
මව/පියා/භාරකරුගේ අත්සන

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :....................................................

දිනය :...................................

.......................................,
සාක්ෂිකරුගේ අත්සන

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :.....................................................

13. භාෂා අවශ්‍යතා.- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියාකළ යුතුවේ.

14. අනන්‍යතාව තහවුරු කිරීම.- අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ‘රියදුරු බලපත්‍රය’ පිළිගනු ලැබේ.

15. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර තෝරා ගතහොත් එම අපේක්ෂකයා මුදවාලිය හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුයි.

16. ඉල්ලුම් පත්‍ර.- ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්කරුගේ ම අත් අකුරින් ලියා **2025 ජූලි මස 30 දින 1200** පැයට හෝ ඊට පෙර ලැබෙන සේ ‘ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය, යුද්ධ හමුදා කඳවුර, සීතාවක,

කොස්ගම' යන ලිපිනයට එවිය යුතුවේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහළ කෙලවරේ 'යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා කෙඩෙට් නිලධාරි පාඨමාලාවේ කෙඩෙට් නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය' යනුවෙන් සඳහන් කළ යුතුවේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මගින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක් ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

17. ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් එවිය යුතුය :

අ. උප්පැන්න සහතිකය.
ආ. ඉදිරිපත්කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික.
ඇ. පාසල් හැරයාමේ සහතිකය.
ඈ. ග්‍රාම නිලධාරි සහතිකය.
ඉ. පොලිස් නිෂ්කාශණ සහතිකය.
ඊ. ක්‍රීඩා හා විෂයය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.
උ. අයදුම්කරු පිළිබඳ දන්නා (චරිත සහතිකයක් නිකුත් කළහැකි අයෙකුගෙන්) පුද්ගලයින්ගෙන් මෑතක දී ලබාගන්නා ලද චරිත සහතික යටත් පිරිසෙයින් දෙකක් හා අයදුම්කරු අවසානවරට ඉගෙනීම ලැබූ පාසලේ විදුහල්පතිගෙන් ලබාගන්නා ලද චරිත සහතිකයක් තිබිය යුතුවේ.
ඌ. අදාළ වෙනත් සහතික.
එ. තවද, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ද මෑතක දී ලබාගත් 2" x 2 ½" ප්‍රමාණයේ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයෙකු විසින් සහතිකකර එවිය යුතුය.

18. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.- ඉහත සඳහන් අවශ්‍යතාවන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් යුද්ධ හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටිය යුතුයි. ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

19. තේරීම් මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපිනයට දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරික්ෂණය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය, කොස්ගම දී පවත්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනයම් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ගෙවනු නොලැබේ.

20. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සහ දැරීම අපේක්ෂකයා නුසුදුස්සෙකු වනු ඇත.

21. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවෙකු වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කරුවන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

**සටහන :** මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

බී. කේ. ජී. එම්. එල්. රොද්‍රිගෝ,
ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී
ලූතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2025 අප්‍රේල් මස 01 වැනි දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

05-12

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2025

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. බඳවා ගැනීමේ ක්‍රමය. :-

විවෘත බඳවා ගැනීම පමණි. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු පුරවනු ලැබේ.

මෙම සම්මුඛ පරීක්ෂණය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් **කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

03. සේවා කොන්දේසි :-

3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව බඳවාගනු ලබන අධිකරණ පවුල් උපදේශක සේවයේ නිලධරයන් ආයතන සංග්‍රහයට, මුදල් රෙගුලාසිවලට, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් නිකුත් කර ඇති සහ කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, නියෝග සහ විධානයන්ට යටත් වන්නේය.

3.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියට බඳවා ගෙන වසර 06 ක් ගතවීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

3.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

3.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුකූලව නිකුත් කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 456 පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ පවුල් උපදේශක සේවයට අදාළ තෘතියික මට්ටම අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුලත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛය අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ පවුල් උපදේශක සේවයට අදාළ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

වැටුප් කේතය - MN 6-2025
වැටුප් පරිමාණය (මාසිකව) - රු. 62,230/- 10 x 1190 – 11 x 1360 – 15 x 1670 – රු.114,140/-

අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියට බඳවාගනු ලබන අයදුම්කරුවන් රු. 62,230/- ක ආරම්භක වැටුප් තලයේ පිහිටුවනු ලබන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛයේ උපලේඛන III පරිදි වැටුප් ගෙවනු ලැබේ.

05. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

විශ්‍රාම වැටුප් සහිත බව ඉහතින් දන්වා තිබුණ ද අනාගතයේ බඳවාගනු ලබන අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියට පත්වන නිලධාරින් සම්බන්ධයෙන් ඔවුන්ට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය හා/හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේ දී ගනු ලබන තීරණයකට ඔවුන් යටත් වන්නේය.

06. සුදුසුකම් :-

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම,

සහ

(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම,

සහ

(ඇ) 2025.05.02 දිනට වයස අවුරුදු 28 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි වීම,

සහ

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ එම කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගත් ආයතනයකින් හෝ පිරිනමනු ලබන මනෝ විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම,

සහ

රජයේ පිළිගත් ආයතනයකින් මනෝ විද්‍යා උපදේශනය පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබිම.

හෝ

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ එම කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගත් ආයතනයකින් හෝ පිරිනමනු ලබන මනෝ විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම,

හෝ

(ඊ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ එම කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගත් ආයතනයකින් හෝ පිරිනමනු ලබන මනෝ විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

***සටහන*** - රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ දැනට සේවය කරන අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අවුරුදු 45 කි.

***සැ.යු.*** - සෑම අයදුම්කරුවකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් **2025 මැයි මස 02** දින හෝ ඊට පෙර සම්පූර්ණකර තිබීම අනිවාර්ය වේ.

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07. අපේක්ෂකයින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු ඒ සඳහා වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත්කළ හැකිය. එසේ වුව ද වරකට තෝරා ගනු ලබන නිලධරයන් සංඛ්‍යාව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :-

වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකළ බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත්කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට යටත් වනු ඇත.

09. අයදුම් කිරීමේ ගාස්තු:-

අයදුම්පත්‍ර ගාස්තුව රු. 400/- කි. මෙම මුදල "අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වෙල්ල විදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 297100199025039 ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.(රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් අයදුම් කිරීමේ ගාස්තුව ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

10. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙ පැත්ත පාවිච්චි කරමින් 8 ½" x 12" (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස්කර අපේක්ෂකයා විසින් ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2025 මැයි මස 30 වැනි දින** හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියට බඳවා ගැනීම 2025" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. **2025 මැයි මස 30 දිනට** පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාර ගනු නොලැබේ.

(ඇ) ඉල්ලුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ඈ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. මෙම රෙගුලාසිවල සලසා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

12. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව

2025 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ පවුල් උපදේශක
II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම - 2025

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය
සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 1
දෙමළ - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු සමඟ නම: Mr./Mrs./Miss. ....................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා . A.P.K. SIRIWARDANA,

2.2 සම්පූර්ණ නම: ..........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

2.3 සම්පූර්ණ නම :.................................................................................................................. ......
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :
................................................................................................................................................

2.5 පදිංචි දිස්ත්‍රික්කය :.........................................................................................................

2.6 සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )
................................................................................................................................................

2.7 ජාතික හැඳුනුම්පත් අංකය :

2.8 උපන් දිනය : .....................................

වර්ෂය: මාසය: දිනය:

2.9 2025.05.02 දිනට වයස :

අවුරුදු : මාස : දින:

2.10 ස්ත්‍රී පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී – 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.11 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක – 2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.12 දුරකථන අංකය :

ස්ථාවර : .......................... ජංගම : .......................... විද්‍යුත් තැපැල: .........................

03. අධ්‍යාපන සුදුසුකම්:

01. .........................................................................................................................

02. ....................................... ..............................................................................
(සහතිකපත්‍රවල ඡායා පිටපතක් අමුණන්න)

04. වෙනත් සුදුසුකම් :.........................................................................................................................................
.........................................................................................................................................................

05. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න)

නැත ☐ ඔව් ☐

‘ඔව්’ නම් විස්තර සඳහන් කරන්න ..........................................................................................

06. අයදුම්පත්‍ර ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

අයදුම්පත්‍ර ගාස්තු ගෙවූ බැංකු ශාඛාව : .......................

ලදුපත් අංකය හා දිනය : ...............................

ගෙවූ මුදල: ...................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

07. අයදුම්කරුගේ සහතිකය:

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇතිවන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නිතීරිතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

....................... ..........................
දිනය අයදුම්කරුගේ අත්සන

08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත අයදුම්පත්‍ර ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

....................... ..........................
දිනය අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :.......................................................................
තනතුර :.......................................................................
ලිපිනය :.......................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම .......................... සේවය කරන ........................ මයා/මිය/මෙනවියට අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණිය සඳහා තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට 2025.05.02 දිනට වයස අවුරුදු 45 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී .............................. දින අත්සන් කළ බව ද නියමිත අයදුම්පත්‍ර ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, සඳහන් කරමින් ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමඟ ඉදිරිපත් කරමි.

දිනය :- දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :-

නිල මුද්‍රාව :-

05-39

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්‍ෂණ බණ්ඩ - 03 සේවා ගණයේ මූලික තාක්ෂණ ශිල්පී III තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025
Open Competitive Examination for Recruitment to Grade III of Railway Basic Technician - 2025

1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ පහත තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පුහුණු කාලසීමාවකට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | පුරප්පාඩු ගණන |
|---|---|---|
| 1 | මූ. තා. ශි. (කම්බිකරු) | 27 |
| 2 | මූ. තා. ශි. (වඩු) | 147 |
| 3 | මූ. තා. ශි. (පෙදරේරු) | 84 |
| 4 | මූ. තා. ශි. (සංකේත ලේඛක) | 2 |
| 5 | මූ. තා. ශි. (පිංතාරු) | 36 |
| 6 | මූ. තා. ශි. (බෙලෙක් වැඩ) | 7 |
| 7 | මූ. තා. ශි. (පොරෑදු) | 5 |
| 8 | මූ. තා. ශි. (වාත්තු) | 16 |
| 9 | මූ. තා. ශි. (ප්‍රගති) | 21 |
| 10 | මූ. තා. ශි. (කම්මල්) | 39 |

02. නිවේදනයේ දක්වා ඇති පුහුණු කාලසීමාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් හා යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ. අවසාන පුරප්පාඩු සංඛ්‍යාව සඳහා හෝ අවසන් පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව තීරණය කාර්ය පටිපාටික රීති 80 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

3. වයස් සීමාව :
ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

4. බඳවා ගැනීමේ කොන්දේසි :
ප්‍රථමයෙන්ම වසරක පුහුණු කාලසීමාවක් සඳහා බඳවාගෙන, එම පුහුණුව සාර්ථකව නිම කරන නිලධාරීන් III වන ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

**පුහුණු කාලසීමාවට බඳවා ගැනීම සඳහා සුදුසුකම්**

අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.;

*හෝ*

ක්ෂේත්‍රයට අදාළ NVQ 03 හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

වෘත්තීය සුදුසුකම් :

| *තනතුරු* | *වෘත්තීය සුදුසුකම්* | *පුහුණු කාලය* |
|---|---|---|
| මු. තා. ශි. (කම්බිකරු)<br>මු. තා. ශි. (සංකේත ලේඛක)<br>මු. තා. ශි. (පිංතාරු)<br>මු. තා. ශි. (බෙලෙක් වැඩ)<br>මු. තා. ශි. (පොරාදු)<br>මු. තා. ශි. (වාත්තු)<br>මු. තා. ශි. (ප්‍රගති)<br>මු. තා. ශි. (කම්මල්) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් වසර 2 1/2 ක් හෝ ඊට වැඩි පූර්ණ කාලීන කාර්මික පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා ඇති අයෙකු වීම. | අවුරුදු 01 |
| මු. තා. ශි. (වඩු)<br>මු. තා. ශි. (පෙදරේරු) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් වඩු හා පෙදරේරු ක්ෂේත්‍රයට අදාල වසරක පුහුණු පාඨමාලාව හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ මාස 18කට නොඅඩු පළපුරුද්දක් ලබා ඇති අයෙකු වීම. | |

5. *වැටුප් පරිමාණය* :

III ශ්‍රේණිය සඳහා

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන I අනුව අදාල වැටුප් පරිමාණය (MT-01-2025) රු. 50,090-10x540-11x630-10x1010-10x1190-84,420 වේ. ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන හි III සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමි වේ.

පුහුණු කාල සීමාව සඳහා :

මාසික දීමනාව : 2025.04.01 - 2025.12.31 දින දක්වා - මාසික දීමනාව රු. 39,637 කි. (ර. ප. ච. 10/2025 අනුව සහ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව)

6. **බඳවා ගැනීමේ ක්‍රමය :**

පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ ලිඛිත විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්කරු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

➢ **පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයයන් :**

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *අනු අංකය* | *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 |
| 02 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

**විෂය නිර්දේශය :**

සාමාන්‍ය දැනීම - ශ්‍රී ලංකාවේ සමාජ, දේශපාලන, සංස්කෘතික හා ආර්ථික පරිසරයද ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ද අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.

බුද්ධි පරීක්ෂණය - අපේක්ෂකයාගේ තර්කානුකූල විශ්ලේෂණ ශක්තියද ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාවද තක්සේරු කිරීමට හැකිවන අයුරු සංඛ්‍යාමය ගැටළු හා භාෂා බාණ්ඩ, වගු යනාදිය ඇතුළත්ව පින්තූර හා ප්‍රස්ථාර උපයෝගී කර ගනිමින් බහුවරණ ක්‍රමයට සැකසුණු ප්‍රශ්න පත්‍රයකි.

- **පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

ලිඛිත තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

| *ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>හදාරා ඇති ඉංග්‍රීසි/දෙමළ භාෂා, පරිගනක සහ වෙනත් පාඨමාලා | 20 |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම්<br>වෘත්තියට අදාළව හදාරා ඇති වෙනත් වෘත්තීය පාඨමාලා<br>(මාස 06 සහ මාස 06කට වැඩි පාඨමාලා සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.) | 30 |
| 3. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද<br>වසරකට ලකුණු 06 බැගින් උපරිම වසර 05ක් සඳහා සලකා බලනු ලැබේ. | 30 |
| 4. විශේෂ/බාහිර දක්ෂතා<br>ක්‍රීඩා/සමාජ සේවා යනාදී | 15 |
| 5. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද ආකල්ප හා පෞරුෂය | 05 |
| එකතුව | 100 |

- **පුහුණු කාලසීමාවෙන් පසුව III ශ්‍රේණියට බඳවා ගැනීමේ ක්‍රමය :**

පුහුණු කාලය සඳහා බඳවා ගන්නා ලද පුහුණුලාභීන් පුහුණුව අවසානයේදී ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කර සමත් වූ අය III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්ෂණය අසමත් වූ අයට නැවත පැවැත්වෙන පුහුණු අවසන් පරීක්ෂණය සඳහා පෙනී සිටීම සඳහා අවස්ථා 02ක් ලබාදෙන අතර ඉන් අසමත් වන අයගේ සේවය අවසන් කරනු ලැබේ.

**පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයයන් :**

එක් ප්‍රශ්න පත්‍රයකින් පමණක් සමන්විත වේ.

| *අනු අංකය* | *විෂයන්* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | තාක්ෂණ විෂය | පැය 02 | 100 | 40 |

විෂය නිර්දේශය :

*තාක්ෂණ විෂය.-* තනතුරට අදාළව දැනගතයුතු මූලික තාක්ෂණික දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්‍ෂණය :

| *අනු අංකය* | *විෂයයන්* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 01 | තාක්ෂණ විෂය | 100 | 40 |

විෂය නිර්දේශය :

*තාක්‍ෂණ විෂය.*- තෝරාගත් විෂයය පිළිබඳ නිපුණතාවය මැන බැලීම සඳහා තනතුරට අදාල තාක්ෂණ විෂය සම්බන්ධයෙන් වූ න්‍යායික දැනුම ප්‍රායෝගිකව හා නිවැරදිව භාවිතයට ගනු ලබන්නේ දැයි මැන බැලීම සඳහා ප්‍රායෝගික පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ.

07. සේවා කොන්දේසි :

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)

සෑම අයැදුම්කරුවෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත් වනු ඇත.

සෑම අයදුම්කරුවෙකුම විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

*සේවා ගිවිසුම පිළිබඳ විස්තර :*

පුහුණු කාලසීමාවට බඳවා ගෙන III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරින් III ශ්‍රේණියට පත්වීම ලද දින සිට වසර 10 ක කාලයක් අනිවාර්යයෙන් ම දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතුය. එසේ වසර 10 ක සේවයට පෙර ඉවත්ව නොයන බවටත් ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් රජයේ සේවකයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් කර වගකීමකට බැඳිය යුතුය.

III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

*රාජ්‍ය භාෂාව :*

රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.

*අනෙක් රාජ්‍ය භාෂාව :* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාල මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය.

තෝරා ගනු ලබන්නන් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක -: PSC/EST/04 -01-43/08/2016 හා 2017.09.07 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 03 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම පරිපාටියට කර ඇති හෝ මින්මතු කරන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 හා 2022.12.14 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

තෝරාගනු ලබන්නන් නියමිත වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වීමට අමතරව දුම්රිය දෙපාර්තමේන්තු උපදෙස් මාලාවට අනුව, තනතුරට අදාළව සමත්විය යුතු විශේෂ දෘෂ්ඨි පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

08. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :

ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අයැදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී

ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගිය හොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පුළුවන. අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු. 750.00 කි. මෙම මුදල අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර දුම්රිය සාමාන්‍යාධිකාරීගේ **මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313** ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. අයදුම් කළයුතු ක්‍රමවේදය :

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.11 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 5.0 තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද, වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කල යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කල හැකිය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු වේ. එසේ නොවුනහොත් එය ප්‍රතික්ෂේප විය හැකිය.

(ආ) අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් ම අයදුම්පත්‍රය සම්පූර්ණ කල යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඇ) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2025.06.02** වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස පහත ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වමත් පස ඉහළ කෙළවරේ පැහැදිළිව "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 03 සේවා ගණයේ මු. තා.ශි. (........) (ඉල්ලුම් කරන ලද තනතුර වරහන් ඇතුළත නිවැරදිව සඳහන් කරන්න) (තනතුරු සඳහා පුහුණු කාල සීමාවට සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරඟ විභාගය 2025" යන්න සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී,<br>
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,<br>
පත්වීම් ශාඛාව,<br>
තැ. පෙ. 355,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10.

(ඈ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්වයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කල විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සටහන් කොට ඉල්ලීම් ලිපියක් 011-2448490 දරන ෆැක්ස් අංකය දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසීම වඩාත්, ඵලදායී වනු ඇත. තවද, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(උ) කිසියම් අයදුම්කරුවෙකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය :

අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය :

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

තවද සිංහල, දෙමළ මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඉංජි. ජේ. අයි. ඩී. ජයසුන්දර,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

2025 අප්‍රේල් මස 04 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්‍ෂණ බණ්ඩ 03 සේවා ගණයේ මූලික තාක්ෂණ ශිල්පී III තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025
Open Competitive Examination for Recruitment to Railway Basic Technician Grade III in Sri Lanka Railways

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.)

ඉල්ලුම් කරනු ලබන තනතුර :- මු. තා. ශි. (......................)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................

උදා :- (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :

උදා : (GUNAWARDHANA, H. M. S. K.) :..........................................................................................

2.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

:..........................................................................................................................................

2.5 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 අදාළ අංකය කොටුව තුළ ලියන්න
ස්ත්‍රී - 1

2.6 ජාතික හැඳුනුම්පත් අංකය :

2.7 විවාහක/අවිවාහක බව : අදාළ අංකය කොටුව තුළ ලියන්න

අවිවාහක - 1
විවාහක - 2

2.8 ජාතිකත්වය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5) -
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.9 උපන් දිනය : වර්ෂය මාසය : දිනය :

2.10 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : මාස : දින :

2.11 දුරකථන අංකය :

3.0 සුදුසුකම් :

3.1 *අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස. (සා.පෙළ) :*

වර්ෂය :........................... විභාග අංකය :...........................

| *විෂයය* | *සමාර්ථය* |
|---|---|
| 1. ............................................ | ................. |
| 2. ............................................ | ................. |
| 3. ............................................ | ................. |
| 4. ............................................ | ................. |
| 5. ............................................ | ................. |
| 6. ............................................ | ................. |
| 7. ............................................ | ................. |
| 8. ............................................ | ................. |
| 9. ............................................ | ................. |
| 10. ............................................ | ................. |

3.2 තෘතික හා වෘත්තීය කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හදාරා ඇති පාඨමාලාවේ නම :

පාඨමාලාවේ කාලය : වසර

...................... දින සිට .................. දින දක්වා

4.0 මුදල් ගෙවූ තැන්පතු පත්‍රිකාවේ පිටපත මනා ලෙස අලවන්න.

| |
|---|
| *මුදල් තැන්පතු පත්‍රිකාවේ (මුල් පිටපත) නොගැලවෙන ලෙස එහි එක් දාරයක් මෙහි අලවන්න. (මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න)* |

5.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද .......... ...................... දිනැති මුදල් තැන්පතු පත්‍රිකාව මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැන මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

______________________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :______________________

6.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට්* නිවේදනයේ 10 (ඇ) පරිදි විය යුතු ය.) :-

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ......................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

_______________________,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :____________________________

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :_______________________
තනතුර :____________________________
ලිපිනය :____________________________

(නිල මුද්‍රාව)

7.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ...................................................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ........................... ලෙස සේවය කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි ය.

...........................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :...........................
පදවි නාමය :...........................
දිනය :...........................

(නිල මුද්‍රාව)

05-17

---

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක ( සිංහල/දෙමළ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් **කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

02. *සේවා කොන්දේසි* :

2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව බඳවාගනු ලබන අධිකරණ ලඝු ලේඛක සේවයේ නිලධරයන් ආයතන සංග්‍රහයට, මුදල් රෙගුලාසිවලට, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් නිකුත් කර ඇති සහ කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, නියෝග සහ විධානයන්ට යටත් වන්නේ ය.

2.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියට බඳවා ගෙන වසර 05 ක් ගත වීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය.

2.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුකූලව නිකුත් කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 456 පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියට අදාළ ද්විතීක මට්ටම අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුලත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛය අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණිය සේවයට අදාළ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

වැටුප් කේතය - (MN 2-2025)
වැටුප් පරිමාණය (මාසිකව) - රු.48,470/– 10 x 540 – 11 x 630 – 10 x 1010 – 10 x 1190 - රු.82,800

අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියට බඳවාගනු ලබන අයදුම්කරුවන් රු.48,470 ක ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ලබන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛයේ උපලේඛන III පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

විශ්‍රාම වැටුප් සහිත බව ඉහතින් දක්වා තිබුණ ද අනාගතයේ බඳවාගනු ලබන අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියට පත්වන නිලධාරීන් සම්බන්ධයෙන් ඔවුන්ට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය හා/හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේ දී ගනු ලබන තීරණයකට ඔවුන් යටත් වන්නේ ය.

05. *සුදුසුකම්* :

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;

(ආ) 2025.05.02 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය;

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය;

(ඈ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය :-

(I) සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී ගණිතය ඇතුලුව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.(අධිකරණ ලඝු ලේඛක (සිංහල) තනතුරට අයදුම් කරන අයදුම්කරුවන්ට සිංහල භාෂාව සඳහා ද, අධිකරණ ලඝු ලේඛක (දෙමළ) තනතුරට අයදුම් කරන අයදුම් කරුවන්ට දෙමළ භාෂාව සඳහා ද සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.);

සහ

(II) ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක ලඝු ලේඛනය සහ යතුරු ලියනය පාඨමාලාවක් සාර්ථකව හදාරා ඉන් සමත්ව තිබීම;

(ඉ) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

*සැ.යු* - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **2025 මැයි මස 02** වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. *විභාග පටිපාටිය* :-

විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු* |
|---|---|---|
| 01 භාෂා හැකියාව (සිංහල/දෙමළ) | 100 | 40 |
| 02 අභියෝග්‍යතාවය (සිංහල/දෙමළ) | 100 | 40 |
| 03 ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල/දෙමළ) | 100 | * |

(* පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ලඝු ලේඛනය හා යතුරු ලියන විෂයයේ සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය අනුව තීරණය කරනු ඇත.)

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයකුට තමන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

අයදුම්කරු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන් පමණක් "භාෂා හැකියාව" හා "අභියෝග්‍යතාව" යන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතු ය.

ලඝු ලේඛනය හා යතුරු ලියනය සඳහා තමන් අයදුම් කරන භාෂා මාධ්‍ය අනුව ප්‍රශ්න පත්‍රය තෝරා ගත යුතු ය. රාජකාරී කටයුතු සඳහා අපේක්ෂකයා සතු සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

*විභාගය සඳහා වන විෂය නිර්දේශය* :

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | භාෂා හැකියාව (සිංහල/දෙමළ) | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ලිපි කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර සහ වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 02 | අභියෝග්‍යතාවය (සිංහල/දෙමළ) | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 03 | ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල/දෙමළ) | **ලඝු ලේඛනය (සිංහල)**<br>විනාඩියකට වචන 70 ක අවම වේගයෙන් විනාඩි 05 ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 07 ක වේගයෙන් යතුරු ලියනය කිරීම<br>**යතුරු ලියනය (සිංහල)**<br>දෙනු ලබන වචන 500 ක ඡේදයක් විනාඩියකට වචන 25 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |
| | | **ලඝු ලේඛනය (දෙමළ)**<br>විනාඩියකට වචන 70 ක අවම වේගයෙන් විනාඩි 05 ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 07 ක වේගයෙන් යතුරු ලියනය කිරීම<br>**යතුරු ලියනය (දෙමළ)**<br>දෙනු ලබන වචන 500 ක ඡේදයක් විනාඩියකට වචන 25 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |

*සටහන* : සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් ම අපැහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩුකරනු ලැබේ.

මෙම ප්‍රශ්නපත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා /හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

07. විභාගයේ සියලු විෂයයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකි ය.

විභාග ප්‍රතිඵල - අයඳුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා මගින් තැපෑලෙන් සිදු කරනු ඇත.

08. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :
වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකළ බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

09. *විභාග ගාස්තු* :
විභාග ගාස්තු රු. 400 කි. මෙම මුදල "අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 297100199025039 ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 ½ x 12 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකි ය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2025 මැයි මස 30 වැනි දින** හෝ ඊට පෙර ලැබෙන පරිදි "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. **2025 මැයි මස 30 වැනි දිනට** පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාර ගනු නොලැබේ.

(ඇ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ඈ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. විභාගයට පෙනී සිටීම - ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර තැපැල් මගින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමඟ ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 0112 421 206 හෝ 0112 446 111 දරන ෆැක්ස් අංකයට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරමින් විමසිය යුතුය. තවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

13. විභාගයට ඇතුළත් වීම-

(අ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියමකර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකු ම ප්‍රවේශ පත්‍රයේ තබන අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින, විභාග ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

සටහන - අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

14. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2025 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය :

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 1

දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

02. පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු සමඟ නම: Mr./Mrs./Miss ................................................................ ............
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා : A.P.K. SIRIWARDANA

2.2 සම්පූර්ණ නම: .................................................................................................................. ……
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

2.3 සම්පූර්ණ නම : .................................................................................................................. ……...
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :
.............................................................................................................................

2.5 පදිංචි දිස්ත්‍රික්කය : ..................................................................................................................

2.6 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :
.............................................................................................................................

2.7 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.8 උපන් දිනය :

වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

2.9 2025.05.02 දිනට වයස :

අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින: [ ][ ]

2.10 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී – 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.11 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක – 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.12 දුරකථන අංකය :

ස්ථාවර : ................................ ජංගම:................................

විද්‍යුත් තැපැල:...............................

03. අධ්‍යාපන සුදුසුකම්:

3.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර:
අ.පො.ස.(සා.පෙළ) (විභාගයේ සහතික කළ සත්‍ය ඡායා පිටපතක් අමුණන්න.)

(1) විභාගයේ වර්ෂය හා මාසය : .........

(2) විභාග අංකය: ..............................

(3) ප්‍රතිඵල: .......................................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

3.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර:

(1) විභාගයේ වර්ෂය හා මාසය :...........

(2) විභාග අංකය:................................

(3) ප්‍රතිඵල:.......................................

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

04. ලඝු ලේඛනය පිළිබඳ හදාරා ඇති පාඨමාලාව : ……………………………………………………
(පාඨමාලාව සමත් සහතිකයේ සහතික කළ සත්‍ය ඡායා පිටපතක් අමුණන්න.)

05. වෙනත් සුදුසුකම් :
.......................................................................................................................................................
.......................................................................................................................................................

06. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න.)

ඔව් ☐ නැත ☐

'ඔව්' නම් විස්තර සඳහන් කරන්න .......................................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර:
විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව: .......................
ලදුපත් අංකය හා දිනය : ................................
ගෙවූ මුදල: ...................................................

08. අයදුම්කරුගේ සහතිකය :

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟවෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

................, ..........................,
දිනය. අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන .................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන .................................. දින තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

......................., ..........................,
දිනය. අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :.........................................................................

තනතුර :........................................................................

ලිපිනය :........................................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම .............................. සේවය කරන ................................................... මයා/මිය/මෙනවියට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල) III ශ්‍රේණිය තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට 2025.05.02 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ..................................... දින අත්සන් කළ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සඳහන් කරමින් ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමඟ ඉදිරිපත් කරමි.

...............................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :-

නිල මුද්‍රාව :-

05-40

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

**2025 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **මැයි** | 2025.05.02 | සිකුරාදා | 2025.04.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.05.09 | සිකුරාදා | 2025.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.05.16 | සිකුරාදා | 2025.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.05.23 | සිකුරාදා | 2025.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.05.30 | සිකුරාදා | 2025.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජුනි** | 2025.06.06 | සිකුරාදා | 2025.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.06.13 | සිකුරාදා | 2025.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.06.20 | සිකුරාදා | 2025.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.06.27 | සිකුරාදා | 2025.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2025.07.04 | සිකුරාදා | 2025.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.07.11 | සිකුරාදා | 2025.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.07.18 | සිකුරාදා | 2025.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.07.25 | සිකුරාදා | 2025.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2025 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.